# පල්ලාවෙල රජ මහා විහාරයේ විනාශ වී යන පුරාවිද්‍යා උරුමය පිළිබඳ සොයා බැලීම

ජී.එම්. සරින් ප්‍රබුද්ධ*

විවිධ හේතුන් නිසා පුරාවිද්‍යා උරුම ස්ථාන විනාශයට පත්වීම වර්තමානයේ දැකිය හැක්කකි. මෙහිදී සාකච්ඡා කරන පල්ලාවෙල කීර්ති ශ්‍රී තේජෝවරාරාමය ක්‍රි.ව. 1700 ට නුදුරු කාලයක සිට ලේඛනගත හා පුරාවෘත සහිත පුදබිමකි. කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ රාජ්‍ය අනුග්‍රහයෙන් උපසම්පදාව පිහිට වූ අතර ප්‍රථම උපසම්පදාව සඳහා පහතරටින් වැඩි සිල්වතුන් වහන්සේලා අතර වූ රන්සැගොඩ ධම්මදස්සී සිල්වතුන් වහන්සේ මේ විහාරයේ ආදි කර්තෘ වෙති. මෙවැනි ඉතිහාසයක් ඇති මෙම විහාරස්ථානයේ විනාශ වී යන උරුමය පිළිබඳ සොයා බැලීම මෙහි අරමුණයි. මහනුවර යුගයට අයත් චිත්‍ර, දහඅට රියන් සැතපෙන බුදුපිළිම වහන්සේ, ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පය සහිත පැරණි බණ මඩුව, දැවයෙන් ඉදිකර ඇති වසර සියයකට වඩා වැඩි මහනුවර යුගයේ චිත්‍ර ඇඳ ඇති පිරිත් මණ්ඩපය, පොත් ගුලෙහි ඇති පැරණි පුස්කොළ පොත් හා ධම්මදස්සී හිමි උඩරට සිට පන්සලට වැඩම වූ පෙරහැරේ ගෙන ආ භාණ්ඩ මෙහි ඇති වටිනා උරුමය යි. මාතර දිස්ත්‍රික්කයේ කන්දබඩ පත්තුවේ බටහිර පල්ලාවෙල ග්‍රාම නිලධාරී වසමේ පල්ලාවෙල කීර්ති ශ්‍රී තේජෝවරාරාම විහාරස්ථානය පිහිටා ඇත. මෙම විහාරස්ථානය පිළිබඳ තොරතුරු සෙවීමේදී ජනතාව මගින් තොරතුරු ලබාගැනීම, නිරීක්ෂණ චාරිකා හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද භාවිතා කරන ලදී. වසර දෙසියයකට වඩා පැරණි ඉතිහාසයක් ඇති මේ විහාරයේ නිරීක්ෂණ මගින් පිළිමගෙයි පිළිම හා චිත්‍ර වලට හානි සිදුවී තිබෙන බවත්, පැරණි ගොඩනැගිලිවල අවිධිමත් වෙනස්කම් මගින් එහි පුරාවිද්‍යා අගයට හානි සිදුවීම, පැරණි ගොඩනැගිලි නිසි ප්‍රතිසංස්කරණයකට ලක් නොවීම නිසා විනාශ වී යමින් පැවතීම මෙහි දී දක්නට විය.

මෙහි දී අවධානයට යොමු වූ කරුණක් වූයේ මෙකී උරුමය පිළිබඳව ජනතාව සැළකිළිමත් නොවීමත්, අලසකමත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිසි අවධානය යොමු නොවීමත් මත උරුමය විනාශ වී යන බවයි. මෙම ගවේෂණ චාරිකාවෙන් බලාපොරොත්තු වන්නේ විනාශ වෙමින් යන උරුමය හඳුනා ගැනීම හා ඊට යෙදිය හැකි පිළියම් පිළිබඳ තොරතුරු සොයා බැලීමය. මේ සඳහා යෝජනා කරන්නේ ජනතාව දැනුවත් කිරීම, පුවරු ප්‍රදර්ශනය, අවට පාසල්වල ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීම, සංරක්ෂණ ක්‍රියාදාමයන්ට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගැනීමත්, පැරණි පුස්කොළ පොත්හි අඩංගු කරුණු පටිගත කර පරිගණක ගත කිරීමත් ය.

ප්‍රමුඛ පද - පල්ලෙවෙල රජමහා විහාරය, පුරාවිද්‍යා උරුමය, සිතුවම්, වාස්තු විද්‍යාව

* පුරාවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය sariprabuddha@gmail.com